# ධනේශ්වරයේ නැඟීම යූජෙනී ග්‍රන්දේ නවකතාවෙන් නිරූපණය වන ආකාරය

ජේ. ඒ. ඩී. සුදේශ් කවීශ්වර[1]

ප්‍රංශ ලේඛක ඔනෝරේ ඩි බල්සාක් (Honore de Balzac) ලියූ Eugénie Grandet සමකාලීන සමාජ ප්‍රවණතා අන්තර්ග්‍රහණය කරගත් කෘතියකි. ආනන්ද අමරසිරි විසින් තත් ග්‍රන්ථය "සිත පිවිතුරු ළඳ" නමින් සිංහලට පරිවර්තනය කරන ලදි. යථාර්ථවාදී සාහිත්‍ය ධාරාව නියෝජනය කරන කතුවරයකු වන බල්සාක් ප්‍රබල ලෙස තත්කාලීන සමාජ යථාර්ථය නිරූපණය කිරීමට යත්න දරා ඇත. යූජෙනී ග්‍රන්දේ ග්‍රන්ථය සහ ඒ පිළිබඳ ව ලියවුණු වෙනත් විචාර කෘති ද්විතීයික මූලාශ්‍රය ලෙස ගෙන කතුවරයා උක්ත නවකතාවෙන් ධනේශ්වරයේ නැඟීම නිරූපණය කළ ආකාරය විමසුමට ලක්කිරීම මේ පර්යේෂණයේ අරමුණ යි. විශේෂයෙන් ම ඔහු නිර්මාණකරණයට අවතීර්ණ වූ අවධිය යථාර්ථවාදී ප්‍රතිනිර්මාණ විධියේ ප්‍රබල නැංමක් සටහන් වූ කාල වකවානුවකි. යථාර්ථවාදී කතාකරුවන්ගේ නිර්මාණ සඳහා ප්‍රබල අනුභූති සැපයුවේ ක්‍රමයෙන් ප්‍රසාරණය වෙමින් පැවති තත්කාලීන ධනේශ්වර සමාජ පරිස්ථිතිය යි. බල්සාක්ට ද ඒ කරුණ එසේ ම බලපෑවේ ය. භෞතික වත්පොහොසත්කම් කෙරෙහි මනුෂ්‍ය සමාජය ප්‍රබල ලෙස නැඹුරු වීමත් සමඟ මානව බැඳීම්හි හා ආධ්‍යාත්මික වටිනාකම්වල පදනම දෙදරා යාම බල්සාක් මැනවින් විශද කරයි. යූජෙනී ග්‍රන්දේ නවකතාව මුළුල්ලෙහි ම ගබ් වන්නේ භෞතික වටිනාකම් හා මිනිස් බැඳීම් අතර පවත්නා අනවරත සංඝට්ටනය යි. එය චරිත කිහිපයක් පදනම් කරගනිමින් කලාත්මක ව ප්‍රතිනිර්මාණය කිරීමට බල්සාක් සමත් තිබේ. කතුවරයා ධනේශ්වර සමාජයේ ජුගුප්සාජනක ස්වභාවය නිරූපණය කරන අතර කිසි දු අවස්ථාවක නිර්මාණ ස්වරූපයෙන් බැහැර නොවීම සුවිශේෂතාවකි. මේ හෙයින් යූජෙනී ග්‍රන්දේ කෘතිය විශිෂ්ට ලෙස තත්කාලීන සමාජය නිරූපණය කරන කලාත්මක නවකතාවක් බවට පත් වෙයි.

**ප්‍රමුඛ පද:** බල්සාක්, යථාර්ථවාදය, ප්‍රතිනිර්මාණය, ධනේශ්වරය, සමකාලීන සමාජය

[1] සිංහල අධ්‍යයනාංශය